*සැ. යු.-* 2023.01.27 දින පළ කරන ලද අංක 2317 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,318 - 2023 පෙබරවාරි මස 03 වැනි සිකුරාදා - 2023.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 156 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 157 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ශිෂ්‍යත්ව ප්‍රකාශන ... ... ... | — |
| ආදායම හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 158 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 පෙබරවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 පෙබරවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

155 B 82424— 403 (2023/02)
A 1-

## ජාතික ශිෂ්‍යභට බලකාය

### සංශෝධනයයි

2020.10.23 වැනි දින පළ කරන ලද අංක 2199 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2020 අංක 903 දරන නිවේදනයේ වූ පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ නිල ස්ථිර කිරීමේ දිනයන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :

**අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම**

2016 සැප්තැම්බර් මස 15 වැනි දින සිට මේජර් නිලයට

නි/5356 කපිතාන් (තාවකාලික මේජර්) පුවක්පිටියගේ දොන් ප්‍රසන්න අරුණ කුමාර විතානගේ
නි/5928 කපිතාන් (තාවකාලික මේජර්) දිසානායක මුදියන්සේලාගේ සමන්ත බණ්ඩාර දිසානායක

2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට මේජර් නිලයට

නි/5247 කපිතාන් (තාවකාලික මේජර්) සෙල්ලප්පුලිගේ ටයිටස් ජෙරාඩ් සෙන්ස්ටස් රෝසා

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
, පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2023 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

02-96

---

## රජයේ නිවේදන

### නිවේදනයයි

වර්ෂ දෙදහස් විසි තුනක් වූ පෙබරවාරි මස දහනව වැනි දින ජාතික ශිෂ්‍යභට බලකා පුහුණු මධ්‍යස්ථානය රන්ටැඹෙහි දී පවත්වනු ලබන පෙළපාළියක දී ජාතික ශිෂ්‍යභට බලකාය වෙත ජනාධිපති හා බලකා වර්ණ ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති උතුමාණන් හා සන්නද්ධ සේවාවන්හි සේනාවිධායක විසින් දයාන්විතව තම සතුට ප්‍රකාශ කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඊ. එම්. එස්. බී. ඒකනායක,
ජනාධිපති ලේකම්.

2023 ජනවාරි මස 09 දින,
කොළඹ - 01.
ජනාධිපති කාර්යාලයේ දී.

02-95